MODULE 2

# ඩිජිටල් සන්නිවේදනය

## ප්‍රකාශනය

පළමු ප්‍රකාශනය 2020 මාර්තු

ප්‍රකාශනය :
ශ්‍රී ලංකාජාතික ක්‍රිස්තියානි එවැන්ජලික සන්ධානය(**NCEASL**)

වෙබ් අඩවියට **www.minormatters.org**

සංස්කාරකට නාලක ගුණවර්ධන

ව්‍යාපෘති සම්බන්ධීකරණය:

යමිනිරවින්ද්‍රන්,අධ්‍යක්ෂ -නීති සහ උපදේශන ෂලෝම් ඩැනියෙල්, නීති සහ උපදේශනසම්බන්ධීකාරක, ආගමික නිදහස සහ සමාජ සාධාරණ කොමිෂන් සභාඅක්ෂිණපළිහවඩන, මාධ්‍ය මූලෝපාය නිලධාරී, ආගමික නිදහස සහ සමාජ සාධාරණ කොමිෂන් සභා

පිට කවර නිර්මාණය: සංජයන් අරියදුරෙ

පිටු පිරිසැලසුම සහ නිර්මාණය: ෂෙනල් ජෙසුඩියන්

Commons Attribution-ShareAlike 3.0 IGO (CC-BY-SA 3.0 IGO) license
බලපත්‍රය යටතේ මෙය භාවිතා කළ හැක.
http://creativecommons.org/licenses/by-sa/3.0/igo/

වියාචනය:

මෙම ප්‍රකාශනයේ අන්තර්ගත විශ්ලේෂණයන් අදහස් දායකයින්ගේ සහ සංස්කාරකවරුන්ගේ අදහස් වේ. ඔවුන් ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි එවැන්ජලික සන්ධානයේ සාමාජිකයන් නොවන අතර සංවිධානය නියෝජනය නොකරයි.

# ඩිජිටල් සන්නිවේදනය

මානවයන් වන බහුලව සන්නිවේදනය කරන ජීවීන් පිරිසකි. එකිනෙකා සමග සන්නිවේදනය කිරීමට අප විසින් භාෂාව සහ මාධ්‍ය සංවර්ධනය කරගෙන තිබේ.

අප තොරතුරු හා අදහස බෙදාහදාගැනීමට පමණක් නොව ඒවා කථනයන් ලෙස පෙළගස්වාගැනීමටත් කැමති ය. එහෙයින් අපි කතන්දර කියන්නන් වෙමු. කතන්දර කීම මානව ශිෂ්ටාචාරය තරම් ම පැරණි ය.

වර්තමානයේදී ඩිජිටල් මෙවලම් සහ අන්තර්ජාලය විසින් වේගවත් සන්නිවේදනයට සහ පුළුල් පාඨක ප්‍රජාවක් වෙත පිවිසීමට අවස්ථාව ලබා දෙයි. ඕනෑම පුද්ගලයකුට සුහුරු දුරකථනයක් සහ අන්තර්ජාල සම්බන්ධයක් සඳහා මූලික ප්‍රවේශ උපකරණ සමගින් තම අදහස් සමස්ත ලෝකයට ම බ්ලොග්, සමාජ මාධ්‍ය, පොඩ්කාස්ට් (podcasts) සහ වෙනත් මාධ්‍ය ඔස්සෙ ප්‍රචාරය කළ හැකි ය.

මෙමඟින් සන්නිවේදනය ප්‍රජාතන්ත්‍රීකරණය වී තිබේ. එවැනි මහා බලයක් සමග සුවිසල් වගකීමක් ද තිබේ.

සන්නිවේදනය යනු පුද්ගල ප්‍රකාශනය පමණක් නොවේ. එය තොරතුරු පර්යේෂණයට, සංවිධානයට සහ පුද්ගලයන් බලමුළුගැන්වීමටත් ප්‍රජාවන් ගොඩනැගීමටත් මෙවලමකි. දුරස්ථ ස්ථානවලත්, විවිධ කාල කලාපවලත් ජීවත් වන මිනිසුන්ට ඩිජිටල් සන්නිවේදනය ඔස්සේ සම්බන්ධ විය හැකි ය. තොරතුරු බෙදාගත හැකි ය. සහයෝගයෙන් කටයුතු කළ හැකි ය.

සන්නිවේදනය වඩා සාර්ථක වන්නේ එය ද්විමාර්ගික ක්‍රියාවලියක් වන විට ය. ජන සන්නිවේදනය බොහෝ විට අන්තර්ගත නිර්මාපකයන්ගේ සිට ග්‍රාහකයන් වෙත ඒක මාර්ග සන්නිවේදනයකි. එයට පරස්පරව, අන්තර්ජාල සන්නිවේදනය දෙපැත්තට ම සිදු විය හැකි ය. වෙබ් විසින් අන්තර්ක්‍රියාකාරිත්වය සහ සහභාගිත්වය පහසු කරයි. අන්තර්ජාලයට පිවිසෙන හැම කෙනෙකුට ම අරමුණක් සහිතව, පරිකල්පනය හා ආචාරශීලිත්වය ඇතිව මෙම මෙවලම් භාවිතා කළ හැකි ය.

සන්නිවේදනයේ වැදගත් මූලිකාංගයක් වන්නේ සවන්දීමේ කලාවයි. තත්කාලීනව තොරතුරු හුවමාරු සහ අදහස් හුවමාරු කරගැනීම ප්‍රයෝජනවත් ය. එහෙත් ඇතැම් විට අපි ප්‍රමාණවත් සිතාබැලීමකින් තොරව ප්‍රතිචාර දක්වන්නෙමු. සමාජ මාධ්‍යයක උණුසුම් විවාදයක් මැද අප විසින් පවසන ලද දේ ගැන අපි ඇතැම් විට කණගාටු වන්නෙමු.

මෙම මොඩියුලයේ අප ආවරණය කරන්නේ ඵලදායී සන්නිවේදනය සහ ඩිජිටල් මෙවලම් ආචාරධාර්මික ලෙස භාවිතය පිළිබඳ මූලික කරුණු කීපයකි. එය වඩා සිතාමතා සහ වගකීම් සහගත ලෙස ඩිජිටල් සන්නිවේදනය පෞද්ගලික හා පොදු මට්ටම්වලදී භාවිතා කිරීම සඳහා දළ මාර්ගෝපදේශයක් ලෙස සලකන්න.

# ප්‍රධාන යෙදුම්

ඩිජිටල් සන්නිවේදනය යන යෙදුමට විවිධ අරුත් තිබේ.

තාක්ෂණික වශයෙන් ගත් කල, එයින් අදහස් වන්නේ ඩිජිටල් සන්නිවේදන පහසුකම් භාවිතා කරමින් සාර්ථක ලෙස සංඥා සම්ප්‍රේෂණය කිරීම සහ ලබාගැනීමයි. එය විදුලි සංදේශ, විකාශ හෝ අන්තර්ජාලය විය හැකි ය.

ඩිජිටල් සන්නිවේදනය යනුවෙන් තවදුරටත් අදහස් වන්නේ තම පණිවුඩය ඩිජිටල් තාක්ෂණයන් සහ අන්තර්ජාලය භාවිතා කරමින් සන්නිවේදනය කරන පුද්ගලයන් සහ කණ්ඩායම් ය. එවැනි සන්නිවේදනයක් පෞද්ගලික හෝ පොදු හෝ විය හැකි ය.

ඩිජිටල් කතන්දර කීම යනුවෙන් අදහස් වන්නේ විවිධ ස්වරූපවල ඩිජිටල් කථනයන් ය. උදාහරණයක් ලෙස වෙබ් පාදක කතා, අන්තර්ක්‍රියාකාරී කතා, වෘතාන්තමය පරිගණක ක්‍රීඩා, ශ්‍රව්‍ය හා දෘෂ්‍ය අන්තර්ගතයන් ආදිය සැලකිය හැකි ය. ඩිජිටල් කතන්දර කියන්නෙකු යනු ජීවන අත්දැකීම්, අදහස් හෝ හැඟීම් කතන්දර සහ ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් කීමේ අවශ්‍යතාව ඇති ඕනෑම අයෙකි.

මූලෝපායික සන්නිවේදනය විසින් සියලු සංවිධානවල, රජයන්ගේ මෙන් ම උද්දේශන හා ක්‍රියාධර කණ්ඩායම්වල ද ධාරිතාවන් අධ්‍යයනය කරනු ලැබේ. එසේම, අරමුණු සහිත සන්නිවේදනයේ ද යෙදේ.



## සන්නිවේදනයේ විවිධ ස්වරූප

ඩිජිටල් සන්නිවේදන ක්‍රම, මෙවලම් සහ මාධ්‍යයන් පසුගිය වසර ගණන තුළ පුළුල් වෙමින් තිබේ. පහත දැක්වෙන්නේ වඩාත් ම සුලබ ඒවා ය.

- අන්තර්ජාලය යනු ලොව විශාලතම සන්නිවේදන පරිගණක ජාලයයි. එමගින් කුඩා, ගෘහස්ථ, විද්‍යාර්ථී, ව්‍යාපාරික සහ රාජ්‍ය ජාලයන් මිලියන් ගණනක් එකට සම්බන්ධ කරයි. ඒවා තුළ විවිධාකාරයේ තොරතුරු අඩංගු වේ. මෙම නම ඇතැම් විට ජාලය ලෙස ද කෙටි වේ.

- ලෝක ව්‍යාප්ත ජාලය ("WWW" හෝ වෙබ්) යනු අන්තර්ජාලයේ ප්‍රමුඛ ම කොටසයි. එහි වෙබ් අඩවි සහ වෙබ් පිටු තිබේ. එය මුලින් ම නිර්මානය කරනු ලැබුවේ 1989දී ටිම් බර්න්ස්-ලී විසිනි. ඒ HTML ඔස්සේ ය. වෙබ් අඩවි සමන්විත වන්නේ අධිපඨිත සම්බන්ධතා (hypertext links) ඔස්සේ ය. ඒවා ලියනු ලබන්නේ HTML භාෂාවෙනි.

- විද්‍යුත් තැපෑල (ඊමේල්) යනු ඊමේල් ලිපිනයක් (ගිණුමක්) හිමි පුද්ගලයනට විද්‍යුත් ඉලෙක්ට්‍රොනික් ක්‍රමයට පණිවුඩ යැවිය හැකි සහ ලබාගත හැකි අන්තර්ජාල සේවාවකි. ඒවා වේගයෙන් යවනු ලබන ලියුම් වැනි ය.

- වොයිස් ඕවර් අන්තර්ජාල ප්‍රොටොකෝලය (VoIP) යනු අන්තර්ජාලය හරහා දුරකථන ඇමතුම් ලබාගත හැකි ක්‍රමයකි. ප්‍රසිද්ධ ම උදාහරණය ස්කයිප් වේ. මෙම තාක්ෂණය භාවිතයෙන් වියදම අඩු වේ. එයට නිශ්චිත දුරකථන සේවාවක් අවශ්‍ය නැත. වර්තමානයේදී බොහෝ සේවා විසින් මෙම පහසුකම සපයනු ලැබේ. බොහෝ සේවාවන්ගේ හඬ මෙන් ම වීඩියෝ ඇමතුම් ගැනීමේ පහසුව ද තිබේ. එහෙත්, වීඩියෝ ඇමතුම් වෙනුවෙන් දත්ත වැය වේ.

- ජංගම දුරකථන යනු අතේ ගෙන යා හැකි කුඩා උපකරණයකි. එය භාවිතා කරමින් ඕනෑම තැනක සිට ඕනෑම වේලාවක සන්නිවේදනය කළ හැකි ය (සංඥා ආවරණය (signal coverage) තිබේ නම්). ආසියාවේ සංවර්ධනය වෙමින් පවතින රටවල ජංගම දුරකථන වෙළඳපොළේ තවමත් වැඩිපුර විකිණෙන්නේ අක්ෂර පණිවුඩ (text messages) යැවිය හැකි, හඬ ඇමතුම් ගත හැකි දුරකථනයි. ඒවායේ එක්කෝ අන්තර්ජාල පහසුකම් නැත. එසේ නොවේ නම් ඇත්තේ ඉතා මඳ ධාරිතාවකිනි. ඒවාට සාපේක්ෂව, විශේෂාංග දුරකථනයක බහුමාධ්‍ය වෙනුවෙන් අමතර පහසුකම් තිබේ (ඡායාරූප, සංගීතය වැනි). ඒවායේ අන්තර්ජාලය වෙත පිවිසීමේ හැකියාව ද තිබේ. ජංගම දුරකථනයක් සුහුරු දුරකථනයක් (smartphone) වන්නේ ඇන්ඩ්‍රොයිඩ්, iOS වැනි මෙහෙයුම් පද්ධතියක් භාවිතා කරන විට ය. ඒ හරහා ඇප් (apps) ධාවනය කළ හැකි ය. සුහුරු දුරකථනවල සාමාන්‍යයෙන් ස්පර්ශක තිරයක් තිබේ. එම තිරයෙන් එහි මුහුණතෙන් 75%ක්වත් ආවරණය වේ. සියලු සුහුරු දුරකථනවලින් අන්තර්ජාලයට පිවිසිය හැකි ය.

- සමාජ මාධ්‍ය යනු වෙබ් අඩවි වර්ගයකි. ඒවා, පරිශීලක සහභාගීත්වය හා සහ පරිශීලකයා විසින් නිර්මාණය කරනු ලබන අන්තර්ගතයන් මත පදනම් වන වෙබ් අඩවි හා ඇප්වලින් සමන්විත වේ. එමගින් එකිනෙකා සමග ගනුදෙනු කිරීමට සහ අන්තර්ගතයන් නිෂ්පාදනයට, ඉදිරිපත් කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට ද ප්‍රාදේශීය, දේශීය, විදේශීය, ගෝලීය වශයෙන් පාඨකයන් සමග සම්බන්ධ වීමට ද හැකියාව ලැබේ. සමාජ මාධ්‍ය අතරට, වෙබ් සංසද, විකි, බ්ලොග් හා ෆෙස්බුක්, ඉන්ස්ටග්‍රෑම්, යූටියුබ්, පින්ටරෙස්ට්, ට්විටර් වැනි සේවා ද අයත් වේ. මෑත කාලයේදී සමාජ මාධ්‍ය හේතුවෙන් සුහුරු දුරකථන භාවිතය ද වැඩි විය.

- ක්ෂණික පණිවුඩ (IM) යනු අන්තර්ජාලය ඔස්සේ තත්කාලීනව පණිවුඩ හුවමාරු කරගැනීමයි. මෙවැනි ඇතැම් යෙදවුම් මගින් ඒ මොහොතේ ටයිප් කරනු ලබන අක්ෂර, අකුරෙන් අකුර සම්ප්‍රේෂණය කිරීමේ හැකියාව තිබේ. වඩාත් ඉහළ මට්ටමේ සේවාවන්ට ලිපිගොනු හුවමාරුව, ක්ලික් කළ හැකි හයිපර්ලින්ක් (hyperlinks), වොයිස් ඕවර් අන්තර්ජාල ප්‍රොටොකෝල (Voice over IP) හෝ වීඩියෝ චැට් ද අඩංගු වේ. මෙවැනි සේවා රැසක් තිබේ. ඇතැම් ඒවා සමාජ මාධ්‍ය අඩවි වෙත සම්බන්ධ ය. සෑම IM සේවාවක් ම, තමන්ට ම හිමි මෘදුකාංග සේවාදායක සේවාවක් වෙනම වැඩසටහනක් ලෙස ඉදිරිපත් කරයි. එසේ නැතිනම් එය බ්‍රව්සරයකට සම්බන්ධ ය. WhatsApp, Viber, Facebook සහ Messenger ශ්‍රී ලංකාවේ ජනප්‍රිය IM සේවා ය.

- SMS (කෙටි පණිවුඩ සේවා) යනු අක්ෂර පණිවුඩ සේවාවකි. එය බොහෝ දුරකථනවල, අන්තර්ජාලයේ සහ ජංගම දුරකථනවල තිබේ. එමගින් ජංගම උපකරණවලින් නිශ්චිත අක්ෂර ගණනකට සීමා වූ කෙටි පණිවුඩ යැවිය හැකි ය. මෑත කාලයේදී වෙනත් ඊට වඩා දියුණු සේවා හඳුන්වා දීම නිසා කෙටි පණිවුඩ ජනප්‍රියත්වය අඩු විය. එහෙත්, කෙටි පණිවුඩ වර්තමානයේදී ද වැදගත් තාක්ෂණයකි. උදාහරණයක් ලෙස යම් ස්ථානයක සිට ආපදා අවදානම් පූර්වයෙන් දැනුවත් කිරීමේ සේවා සැලකිය හැකි ය.

- බ්ලොග් යනු තොරතුරු සහ මතවාද ඇතුළත් වෙබ් අඩවියකි. සාමාන්‍යයෙන් එය මෙහෙයවනු ලබන්නේ එක් කර්තෘවරයකු විසිනි. එම කර්තෘවරයාට බ්ලොග්කරුවකු යයි කියනු ලැබේ. බ්ලොග්කරණයට පෙර පරිශීලකයන්ට වෙබ් අන්තර්ගතයක් නිර්මාණය කිරීමට HTML කේතකරන කුසලතා අවශ්‍ය විය. බ්ලොග් විසින් අන්තර්ජාල ප්‍රවේශය ඇති ඕනෑම කෙනෙකුට අන්තර්ජාලයේ ප්‍රකාශනය සිදු කළ හැකි අන්තර්ගතයන් කළමනාකරණය කිරීමේ පද්ධති හඳුන්වා දෙන ලදී. ඒවා භාවිතයට පහසු ය. බ්ලොග් අවකාශයේ වැඩිපුර ඇත්තේ පුද්ගල බ්ලොග් වුව සාමූහික බ්ලොග් ද තිබේ. ඒවාට කර්තෘවරුන් සමූහයක් විසින් ලිපි යොමු කරනු ලැබේ. ඇතැම් ආයතන විසින් ද විවෘත සංවාද පවත්වා ගෙන යනු පිණිස බ්ලොග් පවත්වාගෙන යනු ලැබේ. ඒ තමන්ගේ වෙබ් අඩවියට අමතරව ය.



# අන්තර්ජාලය සහ වෙබ් යනු එකක් නොවේ

අන්තර්ජලය සහ වෙබ් **(world wide web or www)** අර්ථය නිතර නිතර මාරු කරගනිමින් භාවිතා වේ.  එහෙත්, ඒ දෙක එකක් නොවේ. ඒවා එකිනෙක සම්බන්ධ මුත් එකිනෙකට වෙනස් ප්‍රපංච වෙති.

අන්තර්ජාලයේ පීතෘවරයකු ලෙස සැලකෙන ඇමරිකානු පරිගණක විද්‍යාඥ වින්ට් සර්ෆ් මෙම වෙනස පැහැදිලි කළේ මෙසේ ය: “අන්තර්ජාලය යනු යටින් පිහිටි යටිතල ජාලයයි. එමගින් ලොව පුරා පරිගණක බිලියන් ගණනක් සම්බන්ධ කරනු ලැබේ. ලෝක ව්‍යාප්ත ජාලය යනු මූලික අන්තර්ජාල යටිතලය මත පිහිටුවා තිබෙන යෙදුමකි. මේ දෙක එකක් මත එකක් ලෙස පිහිටයි. ඔබ අන්තර්ජාලයේ අත්දකින බොහෝ දේ ලෝක ව්‍යාප්ත ජාලයයි.”

අන්තර්ජාලය සංවර්ධනය කරනු ලැබුවේ 1960 දශකයේදී ය. පරිගණකවලට එක් ජාලයක් තුළ සන්නිවේදනය කිරීමට අවස්ථාව ලබාදීම එහි අරමුණ විය. මුලින් එක්සත් ජනපදයේ ආරම්භ වු එය පසුව යුරෝපීය ආයතන වෙත ද ව්‍යාප්ත විය.

එහෙත්, පරිගණක ක්‍රමලේඛය හෙවත් කේතකරණය **computer programming** දත් අතළොස්සකට පමණක් එය සීමා විය. භාවිතය පහසු වෙබ් එළිදුටුවේ 1990 දශකයේ මුලදී ය. බ්‍රිතාන්‍ය ජාතික පරිගණක විද්‍යාඥ ටිම් බර්නර්ස් ලීට ඒ සම්බන්ධයෙන් ලෝකය ස්තුතිවන්ත විය යුතු ය.

More: https://www.webopedia.com/DidYouKnow/Internet/Web_vs_Internet.asp


## ඩිජිටල් සන්නිවේදනයේ මූලිකාංග

අප ඉහත ද දක්වා ඇති පරිදි අපට තෝරාගත හැකි ඩිජිටල් සහ වෙබ් පාදක මෙවලම් සංඛ්‍යාව බොහෝ ය. එකී විවිධ සේවාවන් සමග ලියාපදිංචිව පරිශීලක ගිණුමක් සකසා ගත් විට එකී බොහෝ සේවා නොමිලේ ම ලබාගැනීමේ හැකියාව තිබේ.

කෙසේ වෙතත්, මෙසේ තෝරාගැනීමේ හැකියාව ඉහළ යාමෙන් ඔබට ඒ සියල්ල තෝරාගැනීමට සිදු වන බව අදහස් වන්නේ නැත. පෙර නොවූ විරූ ලෙස, දැන් අපට අප කරන සන්නිවේදනය සම්බන්ධයෙන් තෝරාගැනීම් කිරීමට සිදු වේ. එසේ නොමැති නම්, අප විසින් කරනු ලබන්නේ කිසිවකු අපට සවන් දෙනවා ද, අප සමග එක් වනවා ද යන්න ගැන නොසලකා අප විසින් දිගින් දිගට ම අපගේ අදහස් ප්‍රකාශ කිරීමයි.

මූලෝපායික සන්නිවේදනය වැදගත් වන්නේ මෙහිදී ය. එය විස්තර කරනු ලබන්නේ 'තම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා සංවිධානයක් විසින් අරමුණු සහගත ලෙස සන්නිවේදනය භාවිතා කිරීම් ලෙසයි.

මූලෝපායික සන්නිවේදනයේදී, පණිවුඩය සංවර්ධනයට හා මූලික කරුණු නිර්මාණ කිරීම සඳහා ඉහළ මට්ටමක සැලසුම් හා පර්යේෂණ ක්‍රියාවලියක් අවශ්‍ය වේ. මෙම පණිවුඩ ඉලක්ක කරනු ලබන්නේ හෝ නිර්මාණය කරනු ලබන්නේ නිශ්චිත ග්‍රාහක පිරිසක් සිහි තබාගෙන ය. (අඩු වශයෙන්, පැහැදිලිව නිර්වචනය කරන ලද ප්‍රාථමික ග්‍රාහක පිරිසක් තිබේ. ඒ අතර, සෑම කෙනෙකුට ම ද්විතීයක ග්‍රාහකයන් විය හැකි ය).



ඉහත දැක්වෙන රූප සටහන අනුව, මූලෝපායික සන්නිවේදනයට පහත දැක්වේන අදියර හතර අයත් වේ. (ඒ එක් එක් එකට ක්‍රියාමාර්ග කීපයක් බැගින් තිබේ.):

- තක්සේරුව - කුමක් , කා හට සන්නිවේදනය කළ යුතු ද යන්න තේරුම් ගැනීම
- සැලසුම් කිරීම - තෝරාගත් ග්‍රාහකයා / ග්‍රාහකයන් සමග මනා ලෙස සම්බන්ධ වන්නේ කෙසේ ද යන්න තේරුම් ගැනීම
- පණිවුඩ හා ද්‍රව්‍ය නිෂ්පාදනය - මෙය පැමිණෙන්නේ ඉහත පියවර දෙකෙන් පසුව ය.
- ක්‍රියාකාරිත්වය සහ ආපසු සලකාබැලීම - මෙයට බෙදාහැරීම, සම්බන්ධ වීම සහ එම අත්දැකීම තක්සේරු කිරීම ඇතුළත් වේ.

මූලෝපායික සන්නිවේදනයේ මූලධර්ම ඩිජිටල් මෙන් ම ඩිජිටල් නොවන සන්නිවේදනයන්ට අදාළ වේ. දේශපාලන ව්‍යාපාරයක්, සමාජ ක්‍රියාකාරිත්වයක් හෝ නිෂ්පාදන අලෙවිකරණයක් යන ඕනෑම ප්‍රසිද්ධ සන්නිවේදන ස්වරූපයක් සඳහා පැහැදිලි අරමුණක් තිබිය යුතු ය.



A helpful and non-technical guide to strategic communications is at: https://www.jrmyprtr.com/comms-101/

# ඩිජිටල් ආචාරධර්ම

අන්තර්ජාල හෝ ඩිජිටල් ආචාරධර්ම (netiquette) පසුපස තිබෙන අදහස වන්නේ "අනෙක් අය විසින් ඔබට සළකනවාට ඔබ කැමති යමු සේද් ඒ අයුරෙන්ම සෙසු අයට ද සලකන්න" යන්නයි.

ඒ අනුව, ඔබගේ අදහස් අන්තර්ජාලයේ පළකිරීමේදී සහ වෙනත් අය සමග සන්නිවේදනය කිරීමේදී, වෙනත් අයගේ දැක්මට ගරු කළ යුතු ය. පොදු ආචාරශීලිත්වය දැක්විය යුතු ය.

අන්තර්ජාලයේ ක්‍රියා කිරීමේ දී සහ එකිනෙකාට සැලකීමේදී යෝග්‍ය සහ අයෝග්‍ය ආකාර තිබේ. එය බාහිර සමාජයේදී වැනි ම වේ. ඩිජිටල් ලෝකයේ ඔබ ඔබගේ ක්‍රියා හා වචන තෝරාගන්නා ආකාරය අනෙක් අයට බලපෑ හැකි ය. ඔබ කවුරුද යන්න වෙනත් අය අවබෝධ කරගන්නා ආකාරය තීරණය වන්නේ ඒ අනුව ය.

පහත දැක්වෙන්නේ සුලබ උදාහරණ තුනකි.

- ඔබ සිනමා ශාලාවක හෝ රංග ශාලාවක සිටිනවා යයි සිතන්න. යම් අයෙකුගේ ජංගම දුරකථනය නාද වෙයි. අදාළ ස්ථානයට එන විටදී ම එය ක්‍රියා විරහිත කළ යුතුව තිබිණි. එහෙත්, එය ක්‍රියා විරහිත කරනවා වෙනුවට, එම පුද්ගලයා එය භාවිතා කර මහ හඬින් කතාකිරීම මගින් අනෙක් අයට බාධා කිරීම සිදු නොවිය යුත්තකි.


- ඔබ ඔබගේ පවුලේ සාමාජිකයකු, මිතුරකු හෝ සගයකු සමග සාකච්ඡා කරයි. ඒ අතර ඔබගේ ජංගම දුරකථනය පරීක්ෂා කරමින් ලැබෙන පණිවුඩවලට ප්‍රතිචාර දක්වයි. ඔබගේ අවධානය ඔබ ඉදිරියේ සිටින පුද්ගලයා සහ අන්තර්ජාලයෙන් සම්බන්ධ වන පුද්ගලයකු අතර බෙදී යයි. මෙය නරක චර්යාවකි. එමගින් දුර්වල කාල කළමනාකරණයක් ද ඇඟවේ.

- ඊමේල් හුවමාරුවකදී හෝ සමාජ මාධ්‍ය සාකච්ඡාවකදී, යම් කාරණාවක් අවධාරණය කිරීමට අදහස් කරමින් ඔබ කැපිටල් අකුරුවලින් යම් පණිවුඩයක් ඩයිප් කරන්නේ යයි සිතන්න. ඔබ හානියක් කිරීමට අදහස් කරන්නේ නැතිවන්නට පුළුවන. එහෙත්, එය කෑගැසීමක් ලෙස සැලකිය හැකි ය. ඒ අනුව එය නරක චර්යාවකි. අන්තර්ජාල ආචාරධර්ම අනුව, ඊමේල් හෝ පණිවුඩවලදී සියලු අක්ෂර කැපිටල් ලෙස ටයිප් කිරීම නරක දෙයකි. එහෙත්, යම් නිශ්චිත වචන අවධාරණය කිරීම සඳහා ඒවා යොදාගත හැකි ය. සමස්ත වාක්‍යයක් හෝ ඡේදයක් වෙනුවෙන් යොදා නොගත යුතු ය. (සිංහල භාෂාවේ කැපිටල්, සිම්පල් අක්ෂර භේදයක් නොමැති නිසා මෙය අදාළ වන්නේ නැත. සිංහල භාෂාව ඉංග්‍රීසි අකුරෙන් ලිවීම ද යම් ආකාරයකට කරදරකාරී ය.)

ඉහත දැක්වෙන උදාහරණවලදී, මුලින් ම යෙදුණේ බොහෝ සිනමා හෝ රංග ශාලාවලදී අවසර නැති ක්‍රියාවකි. එහිදී වරද කරන්නා අවට සිටින අය විසින් නිශ්ශබ්ද කළ හැකි ය. කළමනාකරණය එම පුද්ගලයාට පිට වන්නැයි කියන්නට ද ඉඩ තිබේ. දෙවන හා තුන්වන උදාහරණවලින් දැක්වෙන්නේ, ආයතනික නීතිවලට වඩා සමාජ ප්‍රතිමාන බිඳදැමීම් ය.

අන්තර්ජාලයේ කටයුතු කිරීමේදී හා ඩිජිටල් මෙවලම් භාවිතා කිරීමේදී කළ යුතු හා නොකළ යුතු බොහෝ දේ තිබේ. මෙහි ලැයිස්තුවක් ඉදිරිපත් කිරීම කළ නොහැකි ය. ඒ හා සම්බන්ධ අන්තර්ජාල මාර්ගෝපදේශ සහ මූලාශ්‍ර රැසක් සොයාගත හැකි ය.

මතක තබාගත යුතු එක් කාරණයක් වන්නේ සැබෑ ජීවිතයේදී කටයුතු කරන ප්‍රමිතිවලින් ම අන්තර්ජාලයේදී ද කටයුතු කළ යුතු බවයි. ගෞරවනීය සහ ආචාරධාර්මික චර්යාව ඒ දෙකෙහිදී ම අදාළ ය.




[2] See, for example, https://uncw.edu/oel/documents/pdfs/netiquette.pdf and https://www.verywellmind.com/ten-rules-of-netiquette-22285

# ට්‍රොල් (Trolls) පෝෂණය නොකරන්න

ට්‍රොල් යනු අන්තර්ජාලයේදී අනෙක් අයට අපහසුව හෝ පීඩාව ඇති කරන වැඩසටහන් විශේෂයකි. ට්‍රොල් විසින් අසමගිය ඇති කර, තම විනෝදය සඳහා අවධානය දිනාගැනීම පිණිස අනවශ්‍ය ආකාරයේ නාට්‍යමය හැසිරීමක් දක්වයි. ඒ සඳහා කුපිත කරවන සුළු, අනවශ්‍ය, මාතෘකාවෙන් නොඅදාළ පණිවුඩ හැඟීම්බර ප්‍රතිචාර දැක්වීම සඳහා සිතාමතා පාඨකයන් වෙත යොමු කරනු ලැබේ.

විවිධාකාරයේ ට්‍රොල් තිබේ. ඇතැම් ඒවා සරල ලෙස පොදු කතිකාවලට විෂ පොවන අතර, ඇතැම් ඒවා විවෘතව අපහාසාත්මක හෝ වෙනස්කම් කරන සුළු අදහස් ප්‍රකාශ කරයි. එසේ කරනුයේ ‘නිදහස් ප්‍රකාශනයේ’ නාමයෙනි. (එයට ද සීමා තිබේ.) සියලු මතභේදාත්මක හෝ ජනප්‍රිය නොවන අදහස් ට්‍රොල්වල ක්‍රියාවන් නොවේ. රැඩිකල් ලෙස එකඟ නොවන අදහස් ඇතැම් විට ප්‍රයෝජනවත් සාකච්ඡා ඇති කරයි. ඒ හේතුවෙන්, යමෙකු ට්‍රොල් කිරීමේ යෙදෙනවා ද, නැතිනම්, අදහස් මත දැඩිව එල්බ කටයුතු කරනවා ද යන්න තේරුම් ගැනීම හැම විට ම පහසු නැත.

ට්‍රොල් මගින් ඇති කරනු ලබන ප්‍රශ්නවලට මුහුණ දෙන්නේ කෙසේ ද? හොඳ ම උපදේශය වන්නේ ඒවා නොතකා හැරීමයි. ඒවාට අවධානය යොමු කිරීමෙන් හෝ ප්‍රතිචාර දැක්වීමෙන් ට්‍රොල් කරන්නන් තෘප්තිමත් නොකරන්න. ඒවා විසින් ඔබ ද නොතකා හරිනු ඇත.



Source: https://theconversation.com/dont-feed-the-trolls-really-is-good-advice-heres-the-evidence-63657

“සියලු ඩිජිටල් මාධ්‍යවලදී, ගෞරව සම්ප්‍රයුක්ත වන්න. ප්‍රකෝපකාරී ප්‍රතිචාර දැක්වීම නොකරන්න. උපහාසය සහ අයෝග්‍ය භාෂ්‍යය භාවිතා කිරීමේදී සැලකිලිමත් වන්න. පෞද්ගලිකව හෝ දුරකථනයෙන් ගැලපෙන දෙය ඇතැම් විට අන්තර්ජාලයේදී ගැලපෙන්නේ නැත. හේතුව, එම සංදර්භය තුළ බොහෝ විට මානව සම්බන්ධකම් නොමැත. ඔබ පළ කරන හෝ යවන ඕනෑම ඊමේලයක් හෝ පණිවුඩයක් සදහටම පිටපත් වී, ගබඩා වී හෝ යවනු ලැබ හෝ තිබිය හැකි බව මතක තබාගන්න. ඒවා අවුරුදු ගණනක් ඔබට බලපෑම් කළ හැකි ය.”

LARRY MAGID, IN DIGITAL ETIQUETTE FOR THE 21ST CENTURY

## ජංගම පුවත්පත් කලාව තේරුම් ගැනීම

ජංගම පුවත්පත් කලාව යනු ඩිජිටල් කතන්දර කීමේ ස්වරූපයකි. එහිදී රූප, ඕඩියෝ හා වීඩියෝ ගොනු නිර්මාණය කිරීමේ හා සංස්කරණය කිරීමේ මූලික උපකරණය වන්නේ සුහුරු දුරකථනයයි. මෙම භාවිතාවෙන් වෘත්තීය මෙන් ම පුරවැසි මාධ්‍යකරුවන්ට ද වාසි සැලසේ.

ජංගම පුවත්පත් කලාවට එක් අර්ථ නිරූපණයක් මෙසේ ය: “එය මාධ්‍ය කතන්දර කීමේ නව ප්‍රවේශයකි. එහිදී, වාර්තාකරුවන් සහ ක්‍රියාකාරිකයන් පූර්ණ වශයෙන් ජංගම උපකරණවලින් සන්නද්ධව සිටින අතර සම්පූර්ණයෙන් ස්වාධීන ය.”

ජංගම පුවත්පත් කලාවේ හදවත වන්නේ සුහුරු දුරකථනයයි. ඒවා පුවත්පත්කලාවේදීන් විසින් සමාජ මාධ්‍යවල රේඩියෝ සහ පොඩ්කාස්ට් (podcast) සඳහාත් රූපවාහිනී ප්‍රවෘත්ති සහ වාර්තා වැඩසටහන් සඳහාත් වැඩි වැඩියෙන් භාවිතා කරනු ලැබේ.

වෙනත් උපකරණයකට වඩා, සුහුරු දුරකථනය විසින් මාධ්‍ය හරහා නිර්මාණශීලිත්වය සහ ඩිජිටල් නව නිර්මාණය දිරිගන්වනු ලැබේ. ඡායාරූප, වීඩියෝ, ශ්‍රව්‍ය හා ග්‍රැෆික් නිර්මාණ එමගින් සංස්කරණය කළ හැකි ය. එයින් ම ප්‍රවෘත්ති මාධ්‍ය වෙබ් අඩවි හෝ සමාජ මාධ්‍ය වෙත ද ඇතුළත් කළ හැකි ය. චැට් ඇප් (chat apps), සමාජ මාධ්‍ය පණිවුඩ හා ඊමේල් ඔස්සේ ග්‍රාහක විමසීම්වලට ප්‍රතිචාර දැක්වීමට ද පුළුවන.



සුහුරු දුරකථනයකට සම්පූර්ණ රේඩියෝ, රූපවාහිනී, ලිඛිත හා සමාජ මාධ්‍ය අන්තර්ගතයන් නිෂ්පාදනය කරන ස්ටුඩියෝවක් බවට පත් විය හැකි ය. ජංගම පුවත්පත් කලාව වෙත යොමු වීම සඳහා හේතු කීපයක් පහත දැක්වේ.

- ලාභදායීත්වය: හොඳ තත්වයේ සුහුරු දුරකථනයක් බාහිර මයික්‍රොෆෝනයක්, ත්‍රිපාදකයක් (tripod), ත්‍රිපාදක සවිකිරීමක් (tripod mount) සහ වෘත්තීය වීඩියෝ ඇප් එකක් සමග සම්බන්ධ කිරීමෙන් රූපවාහිනී ගුණාත්මකබවින් යුත් වීඩියෝ ලබාගත හැකි ය. මෙය සම්ප්‍රදායික විකාශන ගුණයේ වීඩියෝ කැමරාවකට වඩා මිළෙන් අඩු ය.

- තැනින් තැන ගෙන යා හැකි වීම: බොහෝ ජංගම ජනමාධ්‍යවේදීන්ට තම උපකරණ බෑගයක රැගෙන යා හැකි ය. එම උපකරණ අතර, ජංගම දුරකථනය, සැහැල්ලු ත්‍රිපාදය, ක්ලිප් මයික්‍රෆෝන් (clip-microphones) සහ බාහිර ආලෝකයක් තිබේ. සියල්ලෙහි බර කිලෝ තුනකට අඩු ය. මෙම උපකරණ ඇසුරෙන් ඉහළ ගුණාත්මකභාවයකින් යුත් කතන්දර ඕනෑම තැනකදී, ඕනෑම වේලාවක නිර්මාණය කළ හැකි ය.

- විචාරවත්බව: සුහුරු දුරකථන ඉතා සුලබ වීම හේතුවෙන් විචාරවත් ලෙස කටයුතු කරන ජනමාධ්‍යකරුවන්ට එය වටිනා මෙවලමකි.

- පහසුවෙන් භාවිතා කිරීමේ හැකියාව: සුහුරු දුරකථනයේ කුඩාබව හේතුවෙන් සහ ඒවා ඉතා සුලබ වීම හේතුවෙන් ඒවා සම්මුඛ සාකච්ඡාවකදී යොදාගැනීම ඉතා පහසු ය. රොයිටර්ස් පුවත්පත් කලා ආයතනය විසින් සිදු කරන ලද අධ්‍යයනයකදී හෙළි වූ පරිදි පුද්ගලයන් විශාල රූපවාහිනී කැමරාවක් ඉදිරියේදීට වඩා පහසුවෙන් ජංගම දුරකථනයක් ඉදිරියේ සම්මුඛ සාකච්ඡාවකට එකඟ වෙයි.

- නවකයින්ගේ සිට වෘත්තිකයන් දක්වා ඇප්: අයිෆෝන් සහ ඇන්ඩ්‍රොයිඩ් දුරකථනවලින් කතන්දර කීම සඳහා යොදාගත හැකි ඇප් දුසිම් ගණනක් තිබේ. ඇතැම් ඒවා සැලසුම් කර තිබෙන ආකාරයෙන් සජීවීකරණය කරන ලද මාතෘකා, විනෝදාත්මක පාඨ, සංගීතය ආදිය සමග ඉක්මණින් අන්තර්ගතයන් නිර්මාණය කළ හැකි ය. ඒවා ඉගෙන ගැනීම ද පහසු ය. එබැවින් ඒවා අන්තර්ජාලය තුළ හොඳ කතන්දර නිර්මාණය කිරීම සඳහා ඉතා යෝග්‍ය ය.

# ප්‍රධාන සමාජ මාධ්‍ය භාවිතය සඳහා උපදෙස්

## Twitter
ට්විටර්

- ට්‍රැක්ෂන් (traction) ඇති කරගැනීමට හෑෂ්ටැග් භාවිතා කරන්න. #LKA සහ #SriLanka භාවිතා කිරීමෙන් ඔබේ පණිවුඩය ශ්‍රී ලංකාව පිළිබඳ අන්තර්ගතයන් සොයන යන අයට දර්ශනය වේ. එසේම, තම ක්‍රියාමාලා සඳහා කෙටි, බලවත් හෑෂ්ටැග් භාවිතා කිරීම ද වැදගත් ය. ඒ අනුව, එයට සම්බන්ධ වන අයට එක ම අවබෝධයකින් කටයුතු කළ හැකි ය. ක්‍රියාමාලා පිළිබඳ විස්තර වඩා හොඳින් සංවිධානය කරගැනීමේ හැකියාව හෑෂ්ටැග් මගින් ලැබේ.

- යම් කරුණක් හෝ ක්‍රියාමාලාවක් සම්බන්ධයෙන් ඔබගේ සියලු ට්විටර් සහ ඒ හා සම්බන්ධ ට්වීට් පණිවුඩ එක් ත්‍රෙඩ් එකකට හෙවත් හුයකට ගැනීම සඳහා  ට්විටර් මෝමන්ට්ස් (Twitter moments) භාවිතා කරන්න.

- මෙය තොරතුරු සඳහා සමූහ දායකත්වය ලබාගත හැකි ක්‍රමයකි. මතවාද/ නිරීක්ෂණ පිළිබඳ ඉල්ලීම් ට්වීට් කිරීමෙන් ඔබගේ ලිපි සඳහා පුළුල් පරාසයක, වැදගත් අදහස් දායකත්වයන් ගොනු කරගත හැකි ය.  .

- ඔබගේ ට්වීට් සමග ඡායාරූප භාවිතා කරන්න. වීඩියෝ/ ඕඩියෝ අන්තර්ගතයන් සඳහා සෘජු වාදකයන් ( direct players) භාවිතා කරන්න. වසර 2019 මැද වන වර්තමානය වන විට ට්විටර් විනාඩි 2යි තත්පර 20ක් දක්වා වීඩියෝ උඩුගත (upload) කිරීමට අවසර දෙයි. ඊට අමතරව, යූටියුබ් (YouTube) සහ සවුන්ඩ්කල්වුඩ් (SoundCloud) සම්බන්ධතා ද ට්විටර් තුළ ම වාදනය කිරීම (play) කළ හැකි ය. එය පරිශීලකයන්ට පහසුවක් වන බැවින් බැලීමේ/ සවන් දීමේ ඉඩකඩ වැඩි ය.

## Facebook
ෆෙස්බුක්

- ඔබ සාදන වීඩියෝව සෘජුව ෆෙස්බුක් වෙත උඩුගත (Upload) කරන්න. එමඟින් එය බාහිර සම්බන්ධතා මඟින් වාදනය කරනවාට වඩා හොඳින් ඇප් මගින් වාදනය කළ හැකි ය.

- වැදගත් අවස්ථා/ ක්‍රියාමාලා/ මාතෘකා සම්බන්ධයෙන් ගොනු හදන්න. ඔබගේ පළකිරීම්වලදී ඡායාරූප භාවිතා කරන්න. වෙනත් මාධ්‍ය මඟින් වැඩ කළ හැකි සම්බන්ධතා ද ඇතුළත් කරන්න. (ලිපි සම්බන්ධතා, ට්විටර් හෑෂ්ටැග් සම්බන්ධතා ආදී)

**Instagram**

**ඉන්ස්ටග්‍රෑම්**

- දෘෂ්‍ය අන්තර්ගතයන් කෙනෙකු තුළ හැඟීම් ඇති කරයි. හොඳ ඡායාරූපයක් සහ කෙටි තොරතුරු විස්තරයක් මගින් දීර්ඝ, විශ්ලේෂණාත්මක ලිපියකට වැඩි බලපෑමක් සිදු කළ හැකි ය.

- ඉන්ස්ටග්‍රෑම්හි වැඩිපුර සක්‍රිය වන්නේ එය තම ප්‍රධාන තොරතුරු කේන්ද්‍රය, බලපෑම් හා අන්තර් ක්‍රියාකාරී මධ්‍යස්ථානය බවට පත් කරගෙන සිටින්නේ තරුණ පරපුර වන අතර ඔවුන් වෙත සමීප වීමේ පහසුව තිබේ.

- නිරතුරු පළ කිරීම හා හෑෂ්ටැග් භාවිතා කිරීම වැදගත් ය. සත්‍ය අන්තර්ගතය ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් හෑෂ්ටැග් අන්තර්ගත කරන්න. එය ඔබගේ නරඹන්නාට පහසුවකි.

- සමාන කටයුතුවල යෙදී සිටින, සමාන රුචිකත්වයන් ඇති පුද්ගලයන් ඔබේ පළකිරීම සමග ටැග් කරන්න. උදා: මානව හිමිකම් කණ්ඩායම්, පුරවැසි මාධ්‍යකරුවන් ආදීන්

- වැදගත් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් සජීවීව වාර්තා කරන්නේ නම් කතන්දර හෙවත් Stories භාවිතා කරන්න. #LKA, #SriLanka වැනි සාමාන්‍ය හෑෂ්ටැග් යොදන්න.

අවසානයේදී, කෙසේ වෙතත්, නවතම තාක්ෂණික උපකරණ හෝ උපකරණ උපාංග භාවිතයට වඩා වැදගත් වන්නේ ඔබට සන්නිවේදනය කිරීමට අවශ්‍ය කුමක් ද, කාට ද යන්නයි.

# ආරක්ෂිත හා ආචාරධාර්මික ලෙස ඩ්‍රෝන් (DRONE) භාවිතා කිරීම.

මිනිසුන් රහිත ගුවන් වාහන සහ ඩ්‍රෝන යානා වඩා යෝග්‍ය මිලිටරි කටයුතු සඳහා ය. එහෙත්, මෑත වකවානුවේදී ඒවා බොහෝ සාමකාමී කටයුතු සඳහා භාවිතා කරනු ලබන පුරවැසි මෙවලම් බවට ද පත් විය. ඩ්‍රෝන් යානයක මිළ බොහෝ සෙයින් අඩු විය. ප්‍රාථමික මට්ටමේ එවැනි උපකරණයක් ශ්‍රී ලංකාවේදී රු. 30,000කට මිළ දී ගත හැකි ය. ඒවායේ භාවිත හැකියාව ද වර්ධනය වී තිබේ. එමගින් අලුත් භාවිතාකරුවන් සංඛ්‍යාව ද වැඩි වී තිබේ. පුවත් එකතු කිරීමේ සිට පශ්චාත් ආපදා තක්සේරු කිරීම් දක්වා ද, භාණ්ඩ බෙදාහැරීම හා සුහුරු ගොවිතැන සඳහා ද ඩ්‍රෝන යානා භාවිතා කෙරේ.


ශ්‍රී ලංකාවේ මංගලෝත්සව ඡායාරූපගත කරන්නන්, රූපවාහිනී මාධ්‍යකරුවන් සහ දේශපාලන පක්ෂ මුලින් ම ඩ්‍රෝන භාවිතාවට පෙළඹුණි. ඔවුන් විසින් ගුවන් ඡායාරූප හා වීඩියෝවල වටිනාකම තේරුම් ගන්නා ලදී. කාලගුණික විපර්යාස ප්‍රතිඵල, සම්පත් ආශ්‍රිත ගැටුම්, දේශපාලන කැලඹීම් ආදී සංකීර්ණ අවස්ථා පිළිබඳව වඩා හොඳ අවබෝධයක් ලබාගැනීමට ඩ්‍රෝන ජනමාධ්‍යකරුවන්ට හා ක්‍රියාධරයන්ට උපකාර වේ. ඩ්‍රෝන මගින් ලබාගන්නා දෘෂ්‍ය රූප මගින් ක්ෂේත්‍ර වාර්තාකරනය සහ ගවේශනාත්මක පුවත්පත් කලාව ශක්තිමත් කළ හැකි ය.

2016 වසර ආරම්භයේදී පුවත්පත් කලාවේදීන් හා ඡායාරූප පුවත්පත් කලාවේදීන් කිහිපදෙනෙකු ඩ්‍රෝන් ඇසුරෙන් පුවත්පත් කලාව පිළිබඳ පුහුණු කරන ලදී. එය කරනු ලැබුවේ ඩ්‍රෝන් පුවත්පත් කලාව පිළිබඳ උනන්දුවක් දැක්වූ අයෙකු හා ඩ්‍රෝන් නියමුවකු වන සංජන හත්තොටුව සහ පුවත්පත් කලාවේදී ආමන්ත පෙරේරා විසිනි. කුරුළු ඇසකින් බැලීමෙන් ඇතැමෙක් හොඳ කතා නිර්මාණය කරන්නට සමත් වූ හ. වියළි කලාපයේ නියං බලපෑම, නැගෙනහිර වෙරළේ කාත්තන්කුඩි කසල අර්බුදය සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉඩම් භාවිතා රටා ඒ අතර විය.

එසේම, ඩ්‍රෝන් අවභාවිතය හේතුවෙන් පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වයට හා මහජන ආරක්ෂාවට තර්ජන එල්ල විය හැකි ය. දැනටමත් ඇතැම් මාධ්‍ය ආයතන විසින් මහජන ආරක්ෂාව හෝ මාධ්‍ය ආචාර ධර්ම හෝ නොතකමින් ඩ්‍රෝන භාවිතා කර තිබේ. උදාහරණයක් ලෙස, ඝාතනය කරන ලද මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංගගේ සිරුරු කොටස් 2016 සැප්තැම්බරයේදී නැවත ගොඩගත් අවස්ථාවේදී කොළඹ කනත්ත ඉහළින් ඩ්‍රෝනයක් සැරිසැරුවේ ය. ඒ සම්බන්ධයෙන් පවුලේ විරෝධය එල්ල වූ අතර පෞද්ගලිකත්වය පිළිබඳ කාරණා මතු කරන ලදී.

ඩ්‍රෝන මෙහෙයුම් සිදු කළ යුතු ආකාරය පිළිබඳ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා රෙගුලාසි පනවා ප්‍රසිද්ධ කර තිබේ. පුවත්පත් කලාවේදීන් ඇතුළු සියලු භාවිතා කරන්නන්ට එය අදාළ ය. කිලෝග්‍රෑම් එකකට වඩා බරින් අඩු ඩ්‍රෝන සිවිල් ගුවන් සේවා අධිකාරියේ ලියාපදිංචි කිරීම අවශ්‍ය නැත. කිලෝවට වැඩි කිලෝ 25ට අඩු ඩ්‍රෝන සඳහා අධිකාරියේ අවසර ගත යුතු ය. කිලෝ 25ට වැඩි ඩ්‍රෝන සඳහා අවසර ලබාදෙන්නේ නැත. ලියාපදිංචි කරන ලද ඩ්‍රෝන පවා ඇතැම් ප්‍රදේශ තුළ පියාසර කරවිය නොහැකි ය. ඒ අතර, ජනාකීර්ණ ප්‍රදේශ, මහාමාර්ග හෝ දුම්රිය මාර්ග, ජාතික උද්‍යාන සහ අධි ආරක්ෂක කලාප තිබේ. ඩ්‍රෝන නියමුවා හැමවිට ම ඩ්‍රෝනය ධාවනය කළ යුත්තේ තමන්ට එය දැකිය හැකි පරාසයක් තුළ ය.

"අවබෝධයකින් යුතුව සිය කාර්යය ඉටු කරන ලෙස අපි ඩ්‍රෝන ධාවනය කරවන සියලු දෙනාගෙන් ඉල්ලා සිටිමු. ඔවුන් එය ක්‍රීඩා භාණ්ඩයක් ලෙස සැලකිය හැකි මුත්, එය ඇත්ත භාවිතයේදී මෙහෙයුමකි. එමගින් හිංසා, පීඩා ඇති විය හැකි අතර අයෝග්‍ය භාවිතය සම්බන්ධයෙන් නඩු පැවරිය හැකි ය. ආචාරධර්මවලට ගරු කිරීම, පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම සහ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වීම ඩ්‍රෝන මෙහෙයුම්වලදී ඉතා වැදගත් ය," යි මාධ්‍ය අමාත්‍යාංශය විසින් 2017 ජනවාරි මස නිකුත් කරන ලද නිවේදනයක දැක්වේ.



Code of Ethics for Drone Journalists formulated in the United States is available at : http://www.dronejournalism.org/code-of-ethics/
[3] Ministry of Mass Media statement on drone use: http://www.aviationvoice.lk/drone-journalism-sri-lanka-ethics-regulations-guidelines/

## සිද්ධි අධ්‍යයන

### සිද්ධි අධ්‍යයන 1: යාපනයේ ඩිජිටල් කතන්දර කීම

සිවිල් යුද්ධය අවසන් වීමෙන් දශකයකට පසුව, ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ වැසියන් තම ජීවිත, ජීවනෝපායන් සහ ප්‍රජාවන් ගොඩනගාගනිමින් සිටිති. ව්‍යවසායකත්වය පැතිරෙමින් තිබේ. සිවිල් සමාජය ද අවදි වෙමින් තිබේ. එසේ තිබියදී, ප්‍රධාන ධාරාවේ මාධ්‍ය තවමත් අනුගමනය කරන්නේ ඒකාකෘතික ක්‍රමයකි. ඒ අතරින් බොහොමයක් නිශේධාත්මක ය.

"විදේශ මාධ්‍යවලට එරෙහිව වැඩ කිරීම හේතුවෙන් අප ඒකාකෘතික වීමේ නැඹුරුවක් ඇති වේ. එහෙත්, දේශීය මාධ්‍ය අන්තර්ගතයන් ද කරදරකාරී ය. එමගින් ජනයා දෙපැත්තට වෙන් කරනු ලැබේ," යි යාපනය වැසියකු වන තරුණ ජනමාධ්‍යවේදී හා ඩිජිටල් ක්‍රියාකාරික බෙනිස්ලෝස් තුෂාන් පවසයි.

මේ හේතුවෙන් ඔහුට තම තරුණ සගයන් ඩිජිටල් කතන්දර කීම පිළිබඳ පුහුණු කිරීම අවශ්‍ය විය. දැනටමත්, කණ්ඩායම් 10ක තරුණ කාන්තාවන් සහ පිරිමින් මෙම මාස හයේ පාඨමාලාව අවසන් කර තිබේ. එය පිරිනමනු ලබන්නේ නොමිලේ වන අතර යාපනයේ ඇමරිකන් කෝනර් (American Corner) හි දී පාඨමාලාව පැවැත්වේ.

"මෙම පුහුණුවෙන් පිටතට පැමිණි සිසුන් පිරිස 200ක්. (2019 මැද දක්වා) අපි නිරන්තරයෙන් ම අපගේ මොඩියුල යාවත්කාලීන කරනවා," යි තුෂාන් පැවසී ය. "සෑම අයෙකු සතුව ම සුහුරු දුරකථනයක් තිබෙනවා. ඔවුන් පිංතූර ගැනීමට කැමතියි. එහෙත්, පුරවැසි ජනමාධ්‍යකරුවකු වීම වගකිවයුතු කාර්යයක්."

පුවත්පත්වල සේවය කර ඇති අයෙකු වන තුෂාන් සාමය ගොඩනැගීමේ වැඩසටහන්වල ද කොටස්කරුවෙකි. කොළඹ රැකියාව කරන ඔහු සෑම සති අන්තයක ම කිලෝමීටර් 400ක් දුර යාපනයට ගොස් සති අන්තයේ පාඨමාලා පවත්වයි.

"ඩිජිටල් කතන්දර කීමේ පාඨමාලාවේ අරමුණ වන්නේ තරුණයන් අතර ඩිජිටල් කතන්දර කීම පුහුණු කිරීම හා පුරවැසි ජනමාධ්‍යවේදය ප්‍රවර්ධනය කිරීමයි," යි තුෂාන් පවසයි. "මේ වන විට බොහෝ තරුණ ජනයාට සුහුරු දුරකථන තිබෙනවා. ඔවුන්ට අන්තර්ජාල සම්බන්ධයත් තිබෙනවා. ඔවුන් වැඩිදෙනෙකු තම දුරකථනවලින් ඡායාරූප ගන්නට කැමතියි. ඔවුන් තම කතා බෙදාහදාගන්නටත් කැමතියි. එහෙත් එයට මග පෙන්වීමක් නැහැ. මගේ පන්තිවලදී අපි තරුණ ජනයාට ඔවුන් සතු මෙවලම්වලින් පර්යේෂණ කිරීමට දිරිගන්වනවා."

ඩිජිටල් කතන්දර කීමේ පාඨමාලාව විසින් කතන්දර කීමේ කලාවේ, ඡායාරූපකරණයේ සහ දෘෂ්‍ය කතන්දර කීමේ මෙවලම්වල මූලිකාංග ආවරණය කරනු ලැබේ. සහභාගිකයන්ට මාධ්‍ය ආචාරධර්ම, ඉල්ලීමක් කළ විට ඡායාරූපයට නගන මූලාශ්‍රවල නිර්නාමිකත්වය ආරක්ෂා කිරීමේ වැදගත්කම සහ දේශපාලන තත්වයන් පිළිබඳ සංවේදී වීම පිළිබඳ උගන්වනු ලැබේ.

සෑම සහභාගිකයකු ම ඡායාරූප කතාවක් නිර්මාණය කළ යුතු ය. ඒ සඳහා තමන් කැමති මාතෘකාවක් තෝරාගත හැකි ය. බොහෝ උද්‍යෝගී සහ නවෝත්පාදන ව්‍යාපෘති මෙයින් මතු වී තිබේ. ඇතැම් ඒවා ස්වේච්ඡා උත්සාහයන් ලෙස අන්තර්ජාලයේ ක්‍රියාත්මක වේ.

එක් සහභාගිකයකු විසින් 'Everyday Mullaitivu' නමින් ෆේස්බුක් පිටුවක් නිර්මාණය කර තිබෙන අතර ඔහු එහි තම ප්‍රදේශයේ ඡායාරූප ෂෙයා කරනු ලැබේ. මුලතිව් යනු ලංකාවේ අඩුවෙන් ම සංවර්ධනය වූ ප්‍රදේශ අතරින් එකකි. මුලතිව් වෙතින් මතු වන සාධනීය කතා ඔහු විසින් එහි බෙදාහදාගනු ලැබේ.

තවත් සහභාගිකයකු යහළුවකු සමග එක්ව 'Jaffnapedia' ආරම්භ කරන ලදී. ඉන්ස්ටග්‍රෑම් සහ ෆේස්බුක් පිටු භාවිතා කරමින් ඔවුන් යාපනයේ මිනිසුන්ගේ හා ස්ථානවල දිනපතා දර්ශන ලබාගෙන බෙදාහදාගනු ලැබේ. වෙනත් අයට ඡායාරූප එවන්නැයි ඔවුන් විසින් ආරාධනා කර තිබෙන අතර පරිපාලකයන් දෙදෙනා විසින් තෝරාගෙන බෙදාගනු ලැබේ.

තුෂාන් මෙසේ ද කියයි: "කතන්දර කීමෙන් මිනිසුන් සවිබලගැන්වෙනවා. ඔබට ඔබගේ ප්‍රජාවට කතන්දර කීමට හැකි විට ඔබට ප්‍රධාන ධාරාවේ මාධ්‍ය විසින් ඇති කරනු ලබන සමාජ ධ්‍රැවීකරණය සැලකිය යුතු දුරකට වළක්වා ගත හැකියි. අපට අපගේ ප්‍රදේශය පශ්චාත් යුද කලාපයක් ලෙස පමණක් නොවෙයි බලාපොරොත්තු සහගත ප්‍රජාවන් ජීවත් වන ප්‍රදේශයක් ලෙසත් හඳුනාගැනීමට අවශ්‍යයි. අතීත ගැටලු මගහරවා ගන්නට මිනිසුන් මහත් වෙහෙසක් දරනවා."

ඔහු මෙසේ ද කියයි: "අපගේ කතා කියන අයට ඒ කතාන්දරය හැඩගැස්වීමේ හැකියාව තිබෙනවා. අපි අපගේ කතාන්දරය අහිමි කරගත් විට අපගේ බලය ද අපට අහිමි වෙනවා."

More: https://www.thehindu.com/news/international/going-beyond-the-scars-of-the-civil-war/article27950495.ece
https://www.facebook.com/DSTjourney/
https://www.facebook.com/everydaymullaitivu/
https://www.facebook.com/jaffnapedia/

## සිද්ධි අධ්‍යයනය 2: සමාජ මාධ්‍ය ප්‍රකාශනය

සමාජ මාධ්‍ය වාසි වැඩි කරගැනීම සහ ඒවා අවභාවිතය අවම කිරීම සමාජ මාධ්‍ය ප්‍රකාශනයේ අරමුණයි. එය වගකිවයුතු සමාජ මාධ්‍ය භාවිතය පිළිබඳ භාවිතා සංග්‍රහයකි. එය සම්පාදනය කරනු ලැබුවේ ශ්‍රී ලාකාවේ සිවිල් සමාජ සංවිධාන 16ක එකතුවෙන් 2019 වසරේදී ය.

සමාජ මාධ්‍යවල ප්‍රකාශනයේ නිදහසෙහි වැදගත්කම පිළිගන්නා එය, ඒ අතර ම, ආචාරධාර්මික, ප්‍රගතිශීලී, ප්‍රජාතාන්ත්‍රික සහ සමාජ හිතවාදී සමාජ මාධ්‍ය භාවිතයක් ද දිරිගන්වයි.

ඒ සඳහා වෙන් කර තිබෙන වෙබ් අඩවියෙහි මෙසේ සඳහන් වේ. “වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ සමාජ මාධ්‍ය පිළිබඳ කතිකාවතක් ඇති වී තිබේ. ඒ තුළ ඇති ප්‍රකාශනයේ නිදහස සහ මානව හිමිකම් පිළිබඳ සාකච්ඡාව තුළ, විශේෂයෙන් ම ප්‍රතිපත්ති සම්පාදනය කරන්නන් අතර, සමාජ මාධ්‍යවල සැඟවුණු සංකීර්ණ ස්වභාවය, ප්‍රජාතන්ත්‍රවාදය සහ ප්‍රකාශනයේ නිදහස ගැන අනවබෝධයක් තිබේ.”

ස්වේච්ඡා සමාජ මාධ්‍ය ප්‍රකාශනය යනු මෙම අවශ්‍යතාව වෙනුවෙන් වූ සිවිල් සමාජ ප්‍රතිචාරයකි. එහි ඉලක්කය වන්නේ “මේ සම්බන්ධයෙන් මාර්ගෝපදේශ/ ප්‍රකාශන නිර්මාණය කිරීමයි. එය ශ්‍රී ලංකාවේ මාධ්‍ය සහ සිවිල් සමාජය තුළින් මතු විය යුතු ය.”

එහි අරමුණ වන්නේ “වගකිවයුතු සමාජ මාධ්‍ය භාවිතාවක් දිරිගන්වන ප්‍රජාවක් ගොඩනැගීම සහ සමාජ මාධ්‍ය වෙත ප්‍රවේශ වීමට ඇති හිමිකම සහ තොරතුරු පාදක සමාජයක් සඳහා ඉඩ දීම පිණිස ඩිජිටල් සාක්ෂරතාව ශක්තිමත් කිරීමයි. සමාජ මාධ්‍ය අපහරණයට ඇති ඉඩ ප්‍රස්ථා පිළිගන්නා අතර, සමාජ යුක්තිය, මානව ගරුත්වය සහ මානව හිමිකම් රාමුව මත පදනම් වූ මානව සහ සමාජ පරමාදර්ශ හා සම්බන්ධ මූලධර්ම අනුව, ඩිජිටල් හිමිකම් සමාජයක අභ්‍යන්තර අංගයක් වන වන බව මෙම ප්‍රකාශනය මගින් පිළිගනු ලබයි.

සමාජ මාධ්‍ය ප්‍රකාශනයට අත්සන් තබන්නන් විසින් පහත දැක්වෙන ක්‍රියා සිදුවීම අවම කිරීමට හා අවසානයේදී මුලිනුපුටා දැමීමට ගිවිසගනු ලැබේ.

- ජනවර්ගය, ආගම හා කුලය මත සිදුවන වෙනස්කම්
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (ලිංගවාදය, ලිංගික ප්‍රචණ්ඩත්වය, ස්ත්‍රීන්ව නොඉවසීම සහ සමීප රූප සහ වීඩියෝ කැමැත්තෙන් තොරව බෙදාහැරීම එයට අයත් වේ) සහ කාන්තාවන්ට එරෙහි අනෙක් ස්වරූපවල වෙනස්කම් කිරීම්
- ලිංගික අපචාර
- ලිංගික නැඹුරුව සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව මත පදනම්ව කරනු ලබන හිංසා
- ළමා අයිතිවාසිකම් උල්ලංඝනය සහ ළමයින් සූරාකෑම (ළමා අපචාර සහ ළමා වෙළඳාම ඇතුළුව)
- වෛරය, ප්‍රචණ්ඩත්වය, තර්ජන, බලහත්කාරකම්, සයිබර් හිංසන සහ අවදානම් සහගත කතා දිරිගන්වන අන්තර්ගතයන්,
- ආන්තීකරණය කරන ලද ප්‍රජාවන්ට හිංසා කිරීම
- නීති විරෝධී ක්‍රියා
- දත්ත සොරකම සහ ආචාරධර්ම විරෝධී ලෙස තොරතුරු සහ මාධ්‍ය මූලාශ්‍ර අපහරණය (ඡායාරූප අවසර නොමැතිව භාවිතා කිරීම වැනි)
- ව්‍යාජ තොරතුරු, වැරදි තොරතුරු සහ දුස්තොරතුරු
- පැහැදිලි ලිංගික අන්තර්ගතයන් වගකීමකින් තොරව බෙදාගැනීම

වෙබ් අඩවියේ දැක්වෙන ආකාරයට පහත දැක්වෙන සංවිධාන සමාජ මාධ්‍ය ප්‍රකාශනයට අත්සන් තබා තිබේ: විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නැගෙනහිර පළාත් ජනමාධ්‍ය සංසදය, ග්‍රවුන්ඩ්වීව්ස් වෙබ් අඩවිය (Groundviews.org), හෑෂ්ටැග් ජෙනරේෂන්, අන්තර්ජාල මාධ්‍ය ක්‍රියාකාරිත්වය, යාපනය පුවත්පත් සමාජය, ලංකා නිව්ස් වෙබ්, නීතිය හා සමාජ භාරය, මාට්‍රම් වෙබ් අඩවිය. ජාතික ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය , නෙළුම්යාය පදනම, අවුට්බවුන්ඩ් ටුඩේ (Outbound Today), PEACE ECPAT Sri Lanka, රයිට්ස් නව් සාමූහිකය, සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය, ශ්‍රී ලංකා මුස්ලිම් මාධ්‍ය සංසදය, ශ්‍රී ලංකා වෘත්තීය පත්‍ර කලාවේදීන්ගේ සංගමය, ට්‍රාන්ස්පේරන්සි ජාත්‍යන්තරය සහ විකල්ප වෙබ් අඩවිය.

More: http://www.socialmedialanka.org/

## සාකච්ඡා කළ යුතු කරුණු

පහත දැක්වෙන්නේ මෙම මාතෘකාව වැඩිදුර ගවේෂණය සඳහා පාදක කරගත හැකි ප්‍රශ්න කීපයක් සහ සාකච්ඡ කළ යුතු කරුණු ය.

- සන්නිවේදනයේ වැදගත් මූලිකාංගයක් වන්නේ සවන්දීමේ කලාවයි. ඔබ මේ සමග එකඟ වන්නේ නම්, අන්තර්ජාලයේ ලහිලහියේ සාකච්ඡාවලට සහභාගි වීම වෙනුවට පුද්ගලයන්ට නැවතීම, සිතාබැලීම සහ අනතුරුව ප්‍රතිචාර දැක්වීම දිරිගැන්වීම සඳහා කළ යුත්තේ කුමක් ද?
- සමාජ සහ පොදු වාසිය පිණිස මූලෝපායික සන්නිවේදනය යොදාගැනීම පිළිබඳ ශ්‍රී ලංකාවට සුවිශේෂ සාර්ථක උදාහරණ සිහිපත් කළ හැකි ද?
- ඩිජිටල් ආචාරධර්ම පිළිබඳ සාකච්ඡාව විසින් උදාහරණ කීපයක් දක්වා තිබේ. අන්තර්ජාලයේ හොඳ සහ නරක චර්යාවන් නිරූපණය කරන අනෙකුත් උදාහරණ මොනවා ද?
- ඔබ අන්තර්ජාලයේ ට්‍රොල් කිරීම කර තිබේ ද? එසේ කර තිබේ නම්, එබ එය සමග ක්‍රියා කළේ කෙසේ ද?
- ඔබගේ සමාජ මාධ්‍ය මිතුරන්ගේ ලිංගවාදී සහ පුරුෂ මාන්නයෙන් යුතු ප්‍රකාශයන් දුටු විට ඔබ කරන්නේ කුමක් ද? ඔබ ඒවා නොතකා හරිනවා ද? නැතිනම් ප්‍රතිචාර දක්වනවා ද? ප්‍රතිචාර දක්වනවා නම් ඒ කෙසේ ද?
- ශ්‍රී ලංකාවේ යම් තැනක ඩිජිටල් කතන්දර කීම හෝ කිසියම් සමාජ, සංස්කෘතික, දේශපාලන සහ ප්‍රජා මාතෘකා පිළිබඳ ඔබ තවත් උදාහරණ දන්නවා ද?
- ඩිජිටල් සන්නිවේදනය - විශේෂයෙන් ම කෙටි පණිවුඩ සහ ක්ෂණික පණිවුඩ - භාෂා භාවිතයට බලපාන්නේ කෙසේ ද? වචන සහ යෙදුම් කෙටි කර ඇති, දේශීය භාෂා ඉංග්‍රීසි සමග මිශ්‍ර කරගෙන තිබෙන, සාකච්ඡාවට ඉමෝජි (emoji) ඇතුළත් වන උදාහරණ ඔබට හඳුනාගත හැකි ද?

## ඉගෙනුම් ප්‍රතිඵල

මෙම මොඩියුලය අවසානයේදී ඔබට පහත දැක්වෙන කරුණු තේරුම් ගත හැකි වනු ඇත.

- වර්තමාන ඩිජිටල් මෙවලම් සහ වෙබ් විසින් වේගයෙන් සහ පුළුල් ලෙස සන්නිවේදනය කිරීම සඳහා බොහෝ අවස්ථා සලස්වනු ලැබේ. එවැනි දැවැන්ත බලයක් සමග විශාල වගකීමක් ද තිබේ.
- සන්නිවේදනය යනු ද්විමාර්ගික ක්‍රියාවලියකි. ජනසන්නිවේදනය මෙන් නොව, අන්තර්ජාල සන්නිවේදනය දෙපැත්තට ම සිදු විය හැකි ය. එමගින් වඩා හොඳ අන්තර්ක්‍රියා සහ සහභාගිත්වය ඇති කරනු ලැබේ.
- සන්නිවේදනයේ වැදගත් මූලිකාංගයක් වන්නේ සවන්දීමේ කලාවයි. වර්තමාන ඩිජිටල් සන්නිවේදන හදිසිය තුළ අප එය ප්‍රමාණවත් තරමින් කරන්නේ නැත. සැම විට ම නැවතී සිතා බැලීමට එය උපකාර වේ.
- අප සන්නිවේදනය කරන ආකාරය අප විසින් මූලෝපායික ලෙස තෝරාගත යුතුව තිබේ. එසේ නොවුවහොත් සිදුවන්නේ කිසිවකු සවන් දේ ද යන්න නොතකා අප අපගේ අදහස් ප්‍රකාශ කරගෙන යාමයි.
- ඩිජිටල් ආචාරධර්ම මගින් අදහස් වන්නේ වෙනත් පරිශීලකයන්ගේ දැක්මට ගරු කිරීම සහ ඔබගේ දැක්ම අන්තර්ජාලයේ පළ කරන විට හා වෙනත් අය සමග ගනුදෙනු කරන විට පොදු ආචාරශීලීත්වයක් පළකිරීමයි. සැබෑ ලෝකයේදී අනුගමනය කරනු ලබන චර්යාවන් ම අන්තර්ජාල ලෝකයේදී ද අනුගමනය කරන්න.
- ජංගම පුවත්පත් කලාව යනු ඩිජිටල් කතන්දර කීමේ ස්වරූපයකි. එහිදී අන්තර්ගතයන් නිර්මාණය කිරීම පිණිස භාවිතා කරනු ලබන මූලික උපකරණය වන්නේ සුහුරු දුරකථනයයි.

## වැඩිදුර කියවීම සඳහා

ඩිජිටල් කතන්දර කීම: පසුගිය වසර කීපයක් තුළ පහසුකම් සපයන ලද විවිධ වැඩමුළුවලට සහභාගි වූ පුද්ගලයන් විසින් නිර්මාණය කරන ලද ඩිජිටල් කතන්දර කීපයක්.
http://stories.apc.org/

සමාජ වෙනස සඳහා පරිවර්තනීය කතන්දර කීම
https://www.transformativestory.org/

ඔබගේ ඩිජිටල් ආචාරධර්ම සංවර්ධනය සඳහා ක්‍රම 10ක්
https://www.theguardian.com/media/2019/mar/10/10-ways-to-improve-your-digital-etiquette

'Don't feed the trolls' really is good advice – here's the evidence!
https://theconversation.com/dont-feed-the-trolls-really-is-good-advice-heres-the-evidence-63657

ජංගම පුවත්පත්කලා අත්පොත: පුවත් මැදිරි සහ වාර්තාකරුවන්ට මාර්ගෝපදේශයක්
http://www.mojo-manual.org/

MOJO: ජංගම පුවත්පත් කලා අත්පොත
https://ethicaljournalismnetwork.org/mojo-the-mobile-journalism-handbook

ඩ්‍රෝන පුවත්පත්කලා සම්පත්
https://gijn.org/drone-journalism/